# බත් රස දන්නෝ මෙය නොකරන්නෝ....?

ඉන්ද්‍රාණි ජයකොඩි
ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය

ශ්‍රී ලංකාවේ සහල් පරිභෝජනයෙන් 60%-70% ක් පමණ තැම්බූ සහල්වලින් සමන්විත වේ. වැඩි පාරිභෝගික රුචිකත්වයක් දිනා ගෙන ඇති බව එයින් පැහැදිලි වේ. එම නිසා මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම කාලෝචිත බව පෙනී යයි.

තැම්බූ සහල් නිෂ්පාදනය කිරීමේ දී මූලික පියවර වශයෙන් කරනු ලබන්නේ ජලයේවී පෙඟවීමයි. ඒ සඳහා විශාල වශයෙන් ජලය අවශ්‍ය වේ. මෙසේ වී පෙඟවීමට භාවිතා කරන ජලය පිළිබඳ අනුරාධපුර ප්‍රදේශයේ කෙටි විමර්ශනයක් කරන ලදී (ලක්ෂමන් හා ඉන්ද්‍රාණි - 1993). එම විමර්ෂණයේ දී නිරීක්ෂණය කළ කරුණු අනුව වී පෙඟවීමට භාවිතා කරන ජලය ඉතාමත් අපිරිසිදු අතර සෞඛ්‍යමය වශයෙන් දැඩි සැලකිල්ලක් යොමු විය යුතු කරුණු පවා අමතක කරමින් නුසුදුසු පරිසරයක තනා ඇති ළිං වලින් ලබා ගෙන තිබෙන බව පෙනී ගිය එක් කරුණකි. අහඹු ලෙස ලබා ගන්නා ලද ජල නියැදි කිහිපයක් රසායනාගාර විශ්ලේෂණයකට භාජනය කරන ලදී. එහිදී ඉතා ම අපිරිසිදු ජලයේ ජීවත් වන "ඊ" කෝලායි *(E. coli)* හා කෝලිෆෝර්ම් *(Coliform)* යන ක්‍ෂුද්‍ර ජීවීන්ගෙන් මෙම ජලය දූෂිත වී තිබුණු බව අනාවරණය විය. මෙය ඉතාමත් සරළව පැහැදිලි කළහොත් ඊ කෝලායි *(E. coli)* වැනි නිදර්ශක ජීවියෙක් *(Indicator Organisam)* එම ජලයේ ජීවත් වෙනවාය යනු විවිධ මාදිළියේ ක්‍ෂුද්‍ර ජීවීන්ගෙන් එම ජලය අපවිත්‍ර වී ඇති බවට සැකයක් නැතිබව පෙන්නුම් කිරීමකි. එමෙන්ම *E.coli* මෙම ක්‍ෂුද්‍ර ජීවියාගේ නිජබිම වන්නේ අවලතාපීන්ගේ *(Warm Blooded Animal)* මලද්‍රව්‍ය වේ. ඒ අනුව මෙම ජලය දූෂිත වී තිබෙන්නේ මිනිස් මළපහ ද්‍රව්‍ය වලින් හෝ වෙනත් සතුන්ගේ, මළපහ ද්‍රව්‍ය වලින් විය හැකි ය.

මෙහිදී අවධානය යොමු විය යුතු කරුණු වන්නේ, මේ නිසා සෞඛ්‍යයට එල්ල වන තර්ජනය හා ප්‍රධාන ආහාරය වූ බත සඳහා සහල් සැකසීමේ ක්‍රියාවලියේදී දක්වන අල්ප අවධානයයි. මෙසේ සකස් කරන සහල් මිනිස් පරිභෝජනය සඳහා නිපදවන්නක්ය'යි යන මූලික හරය පවා මෙහි දී ඔවුන්ට අමතක වී ඇති බව පෙනී යයි.

මේ සැකසුම් ක්‍රියාවලියේ සෘජු බලපෑමට ලක් වන්නේ වී මෝල් වල වැඩ කරන කම්කරුවන් ය. නිදසුනක් වශයෙන් මේ කාර්යයේ යෙදී සිටින යම් කම්කරුවෙකුගේ ශරීරයේ සම මත සීරීම් හෝ තුවාල සිදු වී තිබුනොත් ඉහත කී දූෂිත ජලයේ සිටින ඇතැම් හානිකර ක්ෂුද්‍ර ජීවීන් තුවාලය හරහා ශරීරගත වීමෙන් ඉතා භයානක රෝග පීඩා (පිටගැස්ම වැනි) ඇති කළ හැකිය.

එමෙන්ම මෙවැනි දූෂිත ජලය භාවිතා කර සැකසූ සහල් පිළිබඳව සත්‍ය වූ නියම තත්ත්වය පාරිභෝගිකයාට හෙළි වූ විට එම සහල් කෙරේ පාරිභෝගික රුචිකත්වය සීඝ්‍ර ලෙස පහළ වැටීම නොවැළැක්විය හැකි ය. නමුත් මේ පිළිබඳ ස්වල්ප අවධානයක් යොමු කර ජලය පවිත්‍ර කිරීමට උපක්‍රමයක් භාවිතා කිරීමෙන් මෙවැනි විශාල හානියක් ඇති කරන ගැටළුවවත් පහසුවෙන් විසඳ ගැනීමට හැකිවේ.